
# සාරාංශය

# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ අවපාලනය

## *මහජන වගවීමක් නොමැතිකම*

**Google Books :** *'Transparency & Public Accountability Fiscal Mismanagement & Lack of Public Accountability Case Study - Sri Lanka, a Country under the purview of IMF, World Bank, ADB'*

*http://www.consultants21.com/page-1-challenges-to-legislations.php*




*විශාලත්වය -8.25 "X 11 "- පිටු ගණන 735*

මෙම ග්‍රන්ථයෙන් විශ්මජනක ලෙස එළිදරව් වන්නේ, ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේද (IMF), ලෝක බැංකුවේද (World Bank), ආසියානු සංවර්ධන බැංකුවේද (ADB) සහ වෙනත් ජාත්‍යන්තර සංවර්ධන ආයතනයන්ගේද නිරන්තර අධීක්ෂණයට යටත් වී ක්‍රියාකාරී වූ රටක් වුවද, එය එසේ ක්‍රියාත්මකව තිබියදීම, ශ්‍රී ලංකාවේ ඇතිවී තිබූ උග්‍ර මූල්‍ය අවපාලනය සහ මහජන වගවීමක් නොමැතිවීම සහ නින්දිත ලෙස මහජන දේපල පිළිබඳව භාරකත්වය සහ යහපාලනය හිතා මතාම පැහැර හැර ඇති බවය.

මහජනයාගේ භාරකාරත්වය දරණ මූලධර්මය සහ මහජන සම්මුතිය උල්ලංඝනය කරමින්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පුදුම සහගත ලෙස බදු සමාවක් මුවාවෙන්, 'පොදු සමා' පනතක්, එනම් 2003 අංක 10 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත, රහසිගතව කඩිමුඩියේ සම්මත කර ගෙන තිබුණේ, පුරවැසියෙකුට එවැනි ව්‍යවස්ථා සම්පාදනයකට එරෙහිව අභියෝග කිරීම සඳහා පවතින අධිකරණ බලය අහෝසි කිරීමට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අනුකූලතාවයෙන් යුතුව ඒ මත නෛතික ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ නිශ්චය ලබා ගැනීමට පවතින අයිතියද ප්‍රායෝගික ලෙස අහිමි කරමින් බව හෙළි වේ.

**මුදල් අමාත්‍යාංශය**
**நிதி அமைச்சு**
**MINISTRY OF FINANCE**

මහ ලේකම් කාර්යාලය, කොළඹ 01. செயலகம், கொழும்பு 01. The Secretariat. Colombo 01.

Office 484500 484600 484700 | Fax (941) 449823 | Telex (941)21409 CE

My No. | Your No. | Date 23rd December, 2002.

" අමාත්‍ය මණ්ඩල සංදේශය

දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත

XXXXXXXXXXXXXXXXXXXXXXX

5. පනත් කෙටුම්පතෙහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අසංගත නොවන බව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පනවා තිබෙන ඕනෑම තහනමකට හෝ සීමා කිරීමකට යටත් නොවන බව, සහ පාර්ලිමේන්තුව විසින් සම්මත කල හැකි බව, ගරු නීතිපති විසින් සහතික කර ඇත.

මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට බලාපොරොත්තු වෙමි.

ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සි, පා.ම
මුදල් අමාත්‍ය "

කර්තෘ විසින්, සාධාරණ හේතූන් මත, ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සි ශ්‍රී ලංකා මුදල් අමාත්‍යවරයා ලෙස පත් කිරීම දැඩි ලෙස විවේචනය කර ඇති ලිපියේ කරුණු, මේ ග්‍රන්ථයේ ඇතුලත් කොට ඇත.

ජාත්‍යන්තර සම්මුතීන් උල්ලංඝනය කරමින්ද, ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්හි මූල්‍ය සම්පාදනය සඳහා අදාලව තිබෙන, ඒ සඳහා මුදල් දීමට විරුද්ධව තිබෙන වර්ෂ 2001 අංක 1373 දරණ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාව කඩකරමින්ද, මෙම 'පොදු සමා' පනත මගින් සමාව දුන් එවැනි අපරාධ ක්‍රියා අතර, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම, ගිනි අවි භාවිතා කිරීම, මුදල් ශුන්‍ය කිරීම, මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම, රහස්‍ය ලෙස පුද්ගලයින් පිටරට යැවීම, අපරාධ මගින් මුදල් උත්පාදනය කිරීම යනාදිය, ඉතා සියුම් ලෙස එම 'පොදු සමා' පනතට, රේගු ආඥා පනත ඇතුලත් කර තිබුණි. එසේ සිදු කරනු ලැබූයේ, ඉහත කී අපරාධ ක්‍රියාවන් ශ්‍රී ලංකාවට ඇතුළු වන ස්ථානවලදී අනාවරණය කර ගෙන, රේගු ආඥා පනත මගින් එයට අදාල නීතින් අනුව ක්‍රියා කිරීමටය. - *එනම්:*

United Nations S/RES/1373 (2001)

# Security Council

Distr.: General

28 September 2001

**1373 (2001)** යෝජනාව

**2001** සැප්තැම්බර් **28** වන දින, එහි **4385** රැස්වීමේ දී ආරක්ෂක මණ්ඩලය විසින් සම්මත කර ඇත.

එවැනි සන්දර්භයක් තුල, දක්වා ඇති දින 7 ක් තුල පනත් කෙටුම්පත අභියෝගයට ලක් කිරීමට එවැනි පෙත්සමක් ගොනු කිරීමට 'හැකිකමක් නොතිබුණ' තත්වය මත, කර්තෘ විසින්, ඉහත කී 2003 අංක 10 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතට එරෙහිව ශ්‍රී ලංකාවේ ඉහලම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරන ලද අතර, ඒ මගින් ඒ මත සමාජයේ පුළුල් ජනමතයක් සහ කතිකාවතක් ඇති කරන ලදී. ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපති, ඒ. එස්. ජයවර්ධන විසින් ඉහත පුළුල් 'පොදු සමා' පනත මගින් ඇතිවන මූල්‍ය හානිය තක්සේරු කර නොමැති බව පිළිගෙන ඇත. - *එනම්:*

A. S. Jayawardena
The Governor

**Central Bank of Sri Lanka**
30, Janadhipathi Mawatha
. Colombo 1, Sri Lanka.

02 JUN 2003

Your Ref. PH/Cosec/M/8/2/2003

30 May 2003

Mr. W. J. S. Karunaratne
Secretary to the President
The Presidential Secretariat
Colombo 1

Dear Sir,

I thank you for your letter No. PH/Cosec/M/8/2/2003 of 22 May, 2003 seeking information pertaining to the Inland Revenue (Special Provisions) Act by 3 June. Since the enactment of the above Act, we have commenced an estimation of its financial impact. This requires collecting detailed information from a large number of institutions and would therefore take some time.

We shall communicate with Her Excellency as soon as our study is completed.

Yours faithfully,

CC: Secretary
Ministry of Finance
(encl. Letter from Secretary to the President)

P.O. BOX 590 Colombo | TEL.: (941) 477477 (941) 477577 | FAX: (941) 477677 | E-mail: jayawar@lanka.ccom.lk asjayaward@cbsl.lk

කර්තෘගේ මෙම පෙත්සමෙහි වැදගත් කරුණු රැසක් ඇතුලත් වී තිබුණේ යයි පවසමින්, ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කර සිටියේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඒ සඳහා අධිකරණ බලයක් නොමැතිකමින් කර්තෘගේ එම අභියෝගය සමඟ ගනුදෙනු කර, මතයක් ප්‍රකාශ කිරීමට නොහැකි බවය. මක් නිසාද යත් ව්‍යවස්ථාවෙහි නියමය පරිදි, මෙම 2003 අංක 10 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතට අදාල කෙටුම්පත පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීමෙන් දින 7 ක් ඇතුලත කර්තෘට මෙම පනත අභියෝගයකට ලක් කිරීමට නොහැකිව තිබූ නිසා වන අතර, එබැවින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඒ පිළිබඳව විශේෂ නිශ්චයක් සිදු කිරීම සඳහා අධිකරණ බල රහිත බැවිනි.

උපහාසාත්මක ලෙස, ආසියානු සංවර්ධන බැංකුව විසින් එම වකවානුවේදීම, එනම් 2003 අගෝස්තු මාසයේ දී, ජාත්‍යන්තර උපදේශකවරුන් වූ 'BearingPoint' සමාගම ඉහත කී විෂයයන් ගවේෂණය කිරීමට බඳවාගෙන තිබූ අතර, ඒ අනුව ඔවුන්ගේ අදාල වාර්තා දෙක 2004.4.16 දින ලබා දී ඇත.

BearingPoint

ASSESSMENT FOR REVENUE ADMINISTRATION REFORM IN SRI LANKA
FINAL REPORT

*FINAL REPORT*

PREPARED FOR:

ASIAN DEVELOPMENT BANK

16 APRIL 2004

BearingPoint

DESIGN AND IMPLEMENTATION PLAN FOR A REVENUE AUTHORITY FOR SRI LANKA

*FINAL REPORT*


PREPARED FOR:

THE REVENUE STEERING COMMITTEE

16 APRIL 2004

කර්තෘ විසින් ඉහත කී ලෙස සමාජයේ සහ මහජනයා අතර ඇති කල ආන්දෝලනය මත, ඉහත කී පුළුල් 'පොදු සමා' පනත යටතේ නියමිත වූ ප්‍රකාශයන්, 2003.6.30 නියමිත දිනයට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා මන්දගාමී තත්වයක් ඇතිව තිබූ බැවින්, රජය විසින් නැවත එකී පනතේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දිනය 2003 ජුලි 1 වන දින සිට 2003 අගෝස්තු 31 දක්වා සිදු කර ගැනීමට හැකි වන සේ, වෙනත් පනතක් ලෙස 2003 අංක 31 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනත ලෙස, නව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී.

මුදල් අමාත්‍ය ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සිට ‘පොදු සමා’ පනත අනුමත කිරිම සම්බන්ධයෙන් විස්තර ලබාදීමට නොහැකි වී තිබූ අතර, එම සන්දර්භය තුල ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 100 ක වාණිජ ණය ගැනීම පිලිබඳව ප්‍රශ්න කර සිටිමින්, ඉහත කී නීතිය අත්හිටුවීම පිණිස අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කර ඇත. - එනම්:



ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

*9th July 2003*

*Hon.K.N.Choksy PC MP*
*Minister of Finance*
*Ministry of Finance*
*Colombo 1.*

*Dear Minister*

***Loan Agreement – City Bank N.A. Tokyo***

*I am in receipt of your letter of 3rd April 2003 replying my letter of 14th February 2003, after several reminders.*


*Subsequently I am informed, despite your evasiveness on the issue, that the Government would be loosing revenue estimated at over Rs.100 billion through the provisions of the general indemnity and pardons legislation proposed by you and introduced by the Government as tax, customs and foreign exchange amnesty legislation.*

*Could you be kind enough to explain the rationale why Government finances require a further injection of US$100 million from foreign commercial banks on commercial terms, when the Government claims the inflow of US$4.5 billion in aid money and can afford to write off penalties dues and levies due of approximately US$1 billion through amnesties.*

*Yours sincerely*

***Chandrika Bandaranaike Kumaratunga***

Democratic Socialist Republic of Sri Lanka



ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

**NOTE TO THE CABINET**

**Repeal of the Inland Revenue**
**(Special Provisions) Act No. 10 of 2003**

XXXXXXXXXXXXXXXXXXXXX

In view of the above, I suggest that all action under this Act No. 10 of 2003 be suspended forthwith and approval of the Cabinet of Ministers be granted to move Parliament to repeal the said Act.

**Chandrika Bandaranaike Kumaratunga,**
**PRESIDENT**

July 10, 2003

Democratic Socialist Republic of Sri Lanka

ඉහත කී නව කෙටුම්පත ශ්‍රී ලංකා පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුලත් කල විගසම, දින 7 ක් ඇතුලත කර්තෘ විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය පතමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත කී කෙටුම්පතේ විධිවිධාන අභියෝගයට ලක් කරන ලද්දේ, එම විධිවිධාන නීතිගත කිරීමට එරෙහිව එය අභියෝගයට ලක් කිරීමට කර්තෘට අයිතියක් තිබේ යයි පතමිනි.

එම අවස්ථාවේදීම ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් ගරු නීතිපති කේ.සී. කමලසබේසන් වෙත පහත සඳහන් ලිපිය යොමු කර ඇත. :

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

*1st August 2003*

*K.C. Kamalasabayson PC*
*Attorney General*
*Attorney General's Department*
*Colombo 12.*

*Dear Attorney General,*

***"Inland Revenue (Special Provisions) (Amendment)***
***A Bill to Amend the Inland Revenue (Special Provisions) Act No. 10 of 2003"***

*I draw your kind attention to Article 77 (1) of the Constitution, whereby, you, as the Attorney General, is constitutionally bounden in duty to examine every Bill for any contravention of the Constitution and for any provisions, which cannot be validly passed, except by the special majority prescribed by the Constitution.*

*The aforesaid Amendment Bill to give further effect to the provisions, which were operative only up to 30.6.2003, of the said piece of legislation, for a further period has been placed on the Order Paper of Parliament on 25.7.2003. This Amendment Bill, I am advised, by reference adopts all the provisions of the aforesaid piece of legislation. In terms of the above constitutional mandate, I require you, as a matter of national and public interest, to forward to me, as a matter of urgent priority, your opinion on the constitutionality of all the said provisions, inasmuch as you forwarded me an unsolicited opinion, respecting a request that is said to have been made to you by the Government Printer.*

*I am constrained to remind you, the dicta of the unanimous determinations made with regard to Presidential powers by a Seven Member Bench of the Supreme Court in relation to the aborted 18th and 19th Amendments to the Constitution.*

*Yours sincerely*

***Chandrika Bandaranaike Kumaratunga***

Democratic Socialist Republic of Sri Lanka

ඉන් අනතුරුව, 2003 අගෝස්තු 18 වන දින කර්තෘගේ පෙත්සම මත ඊට අදාල ශ්‍රේෂ්ඨාධිකරණ විමසුමේදී, කර්තෘගේ ස්ථාවරය වූයේ, 2003 අංක 10 දරණ පළමුවන පනතේ විධිවිධාන ඉහත දින එනම් 2003 ජුනි 30 වන දින අවසන් වූ බවත්, නව කෙටුම්පත, එම විධිවිධාන 2003 ජුලි 1 වන දින සිට 2003 අගෝස්තු 31 වන දින දක්වා නැවත නීතිගත කිරීමට ගත් ප්‍රයත්නයක් බව සහ ඒ අනුව, එම වගන්ති අභියෝගයකට ලක් කිරීමෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විශේෂ නිශ්චයක් ලබා ගැනීමට කර්තෘට ව්‍යවස්ථානුකූලව අයිතියක් ඇති බව පවසමිනි.

එම තර්කයන් නොතකා, එම ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල වූ, අමීර් ඉස්මයිල්, පී. එදුස්සූරිය සහ ටි. බී. වීරසූරිය විනිසුරුවරුන් නිගමනය කර සිටියේ, මෙය හුදු දින වෙනස් කිරීමක් පමණක් බවය. නමුත් යථාර්ථය වන්නේ, ඉහත කී පළමු 2003 අංක 10 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතේ වගන්ති වල නීතිමය සහ වලංගුභාවය අවසන් වූ පසු, මෙම කෙටුම්පත මගින්, නව පුද්ගලයන් කණ්ඩායමකට අදාල වන ලෙස එම විධිවිධාන නැවත නීතිගත කිරීමට කටයුතු කිරීමක් බවයි. ඒ අනුව, එම කෙටුම්පත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2003 අංක 31 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනත ලෙස බලාත්මක කරන ලදී.

කර්තෘ විසින් ඉහත කී දෙවන 'පොදු සමා' පනතත දිර්ඝ කර ගැනීමේ අභියෝගය සිදු කර සිටින සමයේදීම, වෙනත් පනත් දෙකක් එනම්, 1990 අංක 2 දරණ ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සහ 1990 අංක 4 දරණ බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයන්හි තැබීමට ඉදිරිපත් කර තිබූ කෙටුම්පත් දෙකක් කර්තෘ විසින් අභියෝගයට ලක් කිරීමට මැදිහත් වී, පෞද්ගලිකවම ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිට අතර, සැලකිය යුතු වාචික සහ ලිඛිත කරුණු ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

එහි ප්‍රතිඵලයක් වශයෙන් කර්තෘ මෙම පනත් කෙටුම්පත් 2 අභියෝගයට ලක් කිරීමේ ජය අත්පත් කර ගත් අතර, එම කෙටුම්පත් දෙකට අවසර නොදෙමින්, එය නීතියක් ලෙස සම්මත කර ගැනීමෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වළක්වා ලීමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කටයුතු කරන ලදී.

මේ අවස්ථාවේ, අගවිනිසුරු සරත් එන්. සිල්වා විසින් මුලසුන දැරූ ශ්‍රේෂ්ඨාධිකරණයේ පස් පුද්ගල විනිසුරු මඩුල්ලක් වූ ඔහුද ඇතුළු පී. එදුස්සූරිය, හෙක්ටර් එස්. යාපා, ජේ. ඒ. එන්. ද සිල්වා සහ ටි. බී. වීරසූරිය යන විනිසුරුවරුන් විසින්, නව කෙටුම්පත් දෙක තවත් පාර්ශවයන්ට අදාල වන සේ නීති සම්පාදනය කිරීමට ගත් වෑයමක් වූ බව නිරීක්ෂණය කර, එබැවින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු මඩුල්ල විසින් කර්තෘගේ තර්ක පිළිගනිමින් එම කෙටුම්පත් වල අඩංගු විධිවිධාන තවත් සමාජයේ කොටසකට බලපාන ලෙස අලුතින් නීතිය නැවත බලාත්මක කිරීමට උත්සාහ දැරීමක් බව ඒකමතිකව පිළිගැනීම සිදු විය.

ඉහත කී ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ නිශ්චය අනුව, 2003 අංක 31 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනත මත එය ' දිනය හුදු දීර්ඝ කිරීමක්' පමණක් යැයි නිගමනය කිරීම වරදක් බව ඔප්පු වන අතර එය හාස්‍යයටද ලක් වීමකි. ඒ මත පස් පුද්ගල විනිසුරු මඬුල්ලට පී. එදුස්සූරිය හා ටි. බි. වීරසුරිය ඇතුලත් වූ අතර, අදාල 2003 අංක 31 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනත් කෙටුම්පත, කර්තෘ ගේ ඉහත අභියෝගය පටහැනිව ක්‍රියාත්මක කර තිබූ අතර, එම පස් පුද්ගල විනිසුරු මඬුල්ල, අනෙකුත් කරුණු අතරතුර, පහත සඳහන් පරිදි තීන්දු කර ඇත. :

*" සංශෝධනයක් හුදකලාව දැකිය නොහැකිය. එයින් නිසැකවම බලය තිබෙන පනතක් ව්‍යවස්ථානුකූලභාවය හැඩය ලබාගැනීමට නොහැකිය. ............. සාමාන්‍ය ක්‍රියා පටිපාටිය වඩා වෙනත් නීතියක් පැනවීමට ක්‍රියා පටිපාටිය නැගීමට අධිකරණය පහර ගසනු ඇත. .......... "*

ඉහත කී ශ්‍රේෂ්ඨාධිකරණ නිශ්චය මගින් සංශෝධිත කෙටුම්පත් දෙක ඉවත හෙලීමට අමතරව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම පවතින ප්‍රධාන සංශෝධිත පනත්, එනම් 1990 අංක 2 දරණ ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සහ 1990 අංක 4 දරණ බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත් දෙකේ විධිවිධාන වල ප්‍රධාන නීති දැඩි විවේචනයට ලක් කරමින්, විශේෂ නිගමනයක් කර තිබුණේ -*'දරුණු, පීඩාකාරී, අයුතු සහගත මෙන්ම, සාමාන්‍ය ක්‍රියාපටිපාටියකින් තොරව වෙනත් ක්‍රියාපටිපාටියකින් නීතිය හැසිරවීම, නීතියේ සරණ පැතීමට ඉඩ නොදීමක් යැයි ද සඳහන් කරමින්, 'නීතිය, බලවතුන් තවත් ශක්තිමත් කරමින්, අසරණයන් තවත් දුර්වල කරමින්, කටයුතු කිරීමෙන් වැළකී සිටිය යුතු බවය'.*

එහි ප්‍රතිඵලයක් ලෙස, ඉහත සඳහන් කල පරිදි, 'පොදු සමා' පනත් වලට එරෙහිව ගොනු කල නඩු මත ඇති වූ ජනමතයට සහ කතිකාවතට අවනත වී, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඇය සතු අයිතිය ප්‍රකාරව, එම ප්‍රශ්නකාරී පුළුල් 'පොදු සමා' පනත එනම් 2003 අංක 10 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත සහ 2003 අංක 31 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනත පිලිබඳව ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මත ප්‍රකාශයක් අයැද සිටින ලදී. - *එනම්:*

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

8 March 2004

**Hon. Sarath N. Silva**
Chief Justice
Chief Justice's Chambers
Superior Courts Complex
Colombo 12

**Your Lordship,**

I am sending herewith a Reference under Article 129(1) of the Constitution with reference to the Inland Revenue (Special Provisions) Act No.10, 2003 as amended by Act No. 31 of 2003.

I shall be grateful if you would kindly place this before the Supreme Court for their decision.

Yours faithfully

**Chandrika Bandaranaike Kumaratunga**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

මෙම අවස්ථාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පස් පුද්ගල විනිසුරු මඩුල්ලක් වූ, අගවිනිසුරු සරත් එන්. සිල්වා විසින් මුලසුන හෙබවූ, ඔහු ඇතුළු ශිරාණි බණ්ඩාරනායක, හෙක්ටර් එස්. යාපා, ජේ. ඒ. එන්. ද සිල්වා සහ නිහාල් ජයසිංහ යන විනිසුරු මඩුල්ල මගින් ඉහත කී පනත් දෙකම හෙළා දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ, නොයෙකුත් ව්‍යවස්ථාපිත සහ නීතියේ සිද්ධාන්ත මත, එම පනත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් බරපතල ලෙස හෙලා දක්වමින් *'සාධාරණ නීතියට විරුද්ධවාදී බවත්, එය ජාත්‍යන්තර මිනිස් අයිතිවාසිකම් ප්‍රඥප්තියට හා ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය උල්ලංඝනය කිරීමක් බවත්, සහ එම පනත මගින් රජයට මහා පරිමාණයෙන් අලාභ සිදු කරමින්, මහජන ආදායම් වංචා කිරීමක් සිදුවන බවත්'* නිගමනය කරන බවයි.

ඉහත කී ශ්‍රේෂ්ඨාධිකරණයේ 5 පුද්ගල විනිසුරු මඩුල්ලේ මත ප්‍රකාශය මත, මහජන ආන්දෝලනය දැඩිවීමත් සමගම, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් නියමිත කාලයට පෙර 2004 අප්‍රේල් මස කැඳ වූ මහජන ඡන්දයකදී, එවකට එක්සත් ජාතික පෙරමුණ රජය පරාජය වීමට ප්‍රධාන හේතුවක් වූයේ, සමාජයේ සිව් දිසාවේම සාකච්ඡා වලින් ඉහත කී පුළුල් 'පොදු සමා' පනත දැඩි විවේචනයට ලක් වී හෙළා දැකීමය.

## පොතෙන් උපුටා ගත් 'උධෘත'

- අතිශයින් නින්දා කටයුතු පොදු සමා "බද්ද"  - " 2003 අංක 10 දරණ ආදායම් බදු (විශේෂ විධිවිධාන) පනත " නම යටතේ එහි මුවාවෙන් ප්‍රයෝගයෙන් නීතියක් ලෙස හඳුන්වා දෙන ලදී. ඒ නිසා, එවැනි නමක දැක්ම තුළ, මෙය 2000 අංක 38 දරණ දේශීය ආදායම් පනත යටතේ දෙන ලද "ආදායම් බදු සමාව" ලෙසට සියලු දෙනා විශ්වාස කිරීමට නොමඟ යවනු ලබයි. එය "බැටළු හම පොරවා ගත් වෘකයකු" මෙන්, මෙම අදාල "බදු" සමා නීතියෙන්, පහත සඳහන් නීතිද ඇතුළු ආදායම් බදු වලට වඩා වෙනත් කරුණු සමඟ අදාල අනෙකුත් නීති කිහිපයක්, සකස් කර තිබුණි :

  - o රේගු ආඥා පනත (පරිච්ඡේදය 235)
  - o විනිමය පාලන පනත (පරිච්ඡේදය 423)
  - o 1969 අංක 1 දරණ ආනයන හා අපනයන පාලන පනත
  - o 1989 අංක 13 දරණ සුරා බදු (විශේෂ විධිවිධාන) පනත
  - o සුරාබදු ආඥා පනත (පරිච්ඡේදය 52)

- ඉහත නීති යටතේ කිසිදු "බදු" අයකර නොමැත. සත්‍ය වශයෙන්ම, ඉහත නීති, නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කිරීම සහ සමාජයේ නිසි පැවැත්ම සහතික කිරීම සඳහා යම් යම් අපරාධයන් සිදු කිරීම තහනම් කිරීමට වේ. ඉහත නීති යටතේ, දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් ලැබිය යුතු අපරාධ වන සමහර වරදවල් ඇතුළු පහත සඳහන් වරදවල් ඇතුලත් වනු ඇත:

  - o ඖෂධ හා මත්ද්‍රව්‍ය, ගිනි අවි සහ ආරක්ෂක සංවේදී උපකරණ වැනි සීමා කරනු ලැබූ / තහනම් කරනු ලැබූ භාණ්ඩ හොර ජාවාරම් කිරීම ඇතුළු හොර ජාවාරම
  - o පාරිභෝගික අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම, අනෙකුත් කරුණු අතරතුර, වෙළඳපොල තුල පවතින නීති විරෝධී / ව්‍යාජ නිෂ්පාදන සහ / හෝ අනුකරණයන් වැළැක්වීම සඳහා බලාත්මක බුද්ධිමය දේපළ පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම
  - o කසිප්පු ආදී නීති විරෝධී මත්පැන් පෙරීම සහ  බෝතල් නිෂ්පාදනය කිරීම
  - o ගංජා වැවීම සහ ගංජා, අබිං යනාදි මත්ද්‍රව්‍ය ගනුදෙනු කිරීමේ කටයුතු
  - o ජාතික හෝ මහජන යහපතට තහනම් භාණ්ඩ ආනයන සහ / හෝ අපනයනය කිරීම
  - o ජාතික ආර්ථිකයට අහිතකර විනිමය පාලන නීති උල්ලංඝනය කිරීම
  - o ජාත්‍යන්තර සම්මුතීන්  / සංග්‍රහ යටතේ සන්නාමය ලබමින් ශ්‍රී ලංකාවට ඇතුලත් විය හැකි මත්ද්‍රව්‍ය, මත්ද්‍රව්‍ය ජාවාරම්, මිනිස් ජාවාරම්, සහ ත්‍රස්තවාදී සම්බන්ධ මුදල් වංචාවන්

- සත්‍ය වශයෙන්ම, රේගු ආඥා පනත යටතේ, අනෙකුත් නීති කිහිපයක් රේගු දෙපාර්තමේන්තුව විසින් බලාත්මක කර ඇත. පහත සඳහන් පනත් ඇතුළුව සමහරක් නීති රේගු දෙපාර්තමේන්තුව විසින් බලාත්මක කර ඇත.

  - o පුපුරණ ද්‍රව්‍ය පනත
  - o ගිනි අවි ආඥා පනත
  - o අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත

o විෂ වර්ග, අබිං හා අන්තරායකාරි ඖෂධ ආඥා පනත
o ආහාර පාලන පනත
o බුද්ධිමය දේපල පනත
o තේ පාලන පනත / රබර් පාලන පනත
o පුරාවස්තු ආඥා පනත
o සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත
o ධීවර හා ජලජ සම්පත් පනත

➢ ඒ නිසා, ඖෂධ ජාවාරම්, ගිනි අවි, ව්‍යාජ මුදල්, ත්‍රස්තවාදය / ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සැපයීම්, කසිප්පු නිෂ්පාදනය ආදිය ඇතුළු වන වරදවල් සිදු කර ඇති අය සඳහා "ආදායම් බදු සමාව" මුවාවෙන් ඒ යටතේ සම්පූර්ණ මුක්තිය, හානි රක්ෂණය හා සමාව ලබා දී ඇත.

➢ ඉහත නීති වලට අමතරව, "ආදායම් බදු" සමඟ සම්බන්ධ නැති සියලු නීති සඳහා, පාරිභෝගික ජනතාවගෙන් වක්‍ර බදු අයකර ගැනීම සඳහා සම්බන්ධිත පහත සඳහන් නීතිද, අතිශයින් නින්දා කටයුතු පොදු සමා බද්දෙහි ලේඛනගත කර ඇත. එනම්, විමර්ශනයන්ගෙන් රක්ෂණය වීමට, මුක්තිය ලැබීමට සහ ආරක්ෂා වීමට සහ සමාව ලැබීමට, 2003 අංක 10 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත පැවතීම.

o 1981 අංක 69 දරණ පිරිවැටුම් බදු පනත
o 1991 අංක 52 දරණ ජාතික ආරක්ෂක බදු පනත
o 1996 අංක 34 දරණ භාණ්ඩ හා සේවා බදු පනත
o 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනත
o 1963 අංක 11 දරණ මුදල් පනත
o 1996 අංක 5 දරණ ජාතික දායකත්වය සුරැකීමේ පනත

ඉන්පසු, බලයට පත් වූ පොදුජන එක්සත් පෙරමුණ රජය ඒ විගසම පළමු කෙටුම්පත ලෙස දේශීය ආදායම් (පොදු සමා නියාමනය) පනත් කෙටුම්පත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එම පනත් කෙටුම්පත මගින් ඉහත කී ආදායම් බදු සමාව පමණක් ඉතුරු කොට අනික් විවේචනයට ලක් වූ සියලු සමාවන් එම පුළුල් 'පොදු සමා' පනත මගින් අවලංගු කරන ලදී. එම නව පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කොට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ නිශ්චයකට පසුව, 2004 අංක 10 දරණ දේශීය ආදායම් (පොදු සමා නියාමනය) පනත ලෙස, පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගන්නා ලදී. - *එනම්:*

මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
**MINISTRY OF FINANCE**

මහ ලේකම් කාර්යාලය, කොළඹ 01. செயலகம், கொழும்பு 01. The Secretariat, Colombo 01.

Office 484500, 484600, 484700 | Fax (941) 449823 | Telex (941)21409 CE

My No. | Your No. | Date

**2004 ජුනි 9**

**අමාත්‍ය මණ්ඩල සංදේශය**

**2003 අංක 10 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනත සහ 2003 අංක 31 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) (සංශෝධිත) පනත අහෝසි කිරීම සහ 2002 අංක 7 දරණ දේශීය ආදායම් (විශේෂ විධිවිධාන) පනතට සංශෝධනය හඳුන්වා දීම**

**XXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXX**

නමුත් මෙම නව 2004 අංක 10 දරණ දේශීය ආදායම් (පොදු සමා නියාමනය) පනතේ විධිවිධාන ක්‍රියාවට නැංවීමට, විශේෂයෙන්ම දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මන්දගාමීව කටයුතු කල බවට අනාවරණය වූ බැවින්, කර්තෘ විසින් අභියාචනාධිකරණයේ රිට් අයැදුමක් ගොනු කර, එම නව 2004 අංක 10 දරණ දේශීය ආදායම් (පොදු සමා නියාමනය) පනතෙහි විධිවිධාන බලාත්මක කර ගැනීම සඳහා අවසර පතන ලදී.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
**MINISTRY OF FINANCE AND PLANNING**

මහ ලේකම් කාර්යාලය, කොළඹ 01. செயலகம், கொழும்பு 01. The Secretariat, Colombo 01.

Office 2484500, 2484600, 2484700 | Fax (94)-011-2449823 | Website www.treasury.gov.lk

My No. | Your No. | Date 1st July, 2005

Commissioner General
Dept. of Inland Revenue

Dear Sri,

**ENFORCEMENT OF INLAND REVENUE (REGULATION OF AMNESTY) ACT No: 10 of 2004**

Chairman, Public Enterprise Reform Commission has written to Her Excellence the President (a copy which has been submitted to me) informing that you have not responded to his letter dated 10.6.2005regarding the enforcement of Inland Revenue (Regulation of Amnesty) Act No:10 of 2004. He has further stated that you have not responded to 3 letters of Controller of Exchange as well.

Please clarify the position.

Yours faithfully,

P B Jayasundera
**Secretary to the Treasury**

Cc: Secretary to the President
Controller of Exchange
Chairman - PERC

RECEIVED 04 JUL 2005

එවකට ගරු නීතිපති කේ. සී. කමලසබේසන් රජය හා රජයේ අදාල ආයතන ක්‍රියාකාරීන් වෙනුවෙන් එම රිට් ආඥාව එකඟත්වයකින් පිළිගැනීමට බේරුම්කරණ ගිවිසුමක් සකස් කර ඇත. කෙසේ වෙතත් ඉන් අනතුරුව, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ඉහල නිලධාරීන් සහ පසුව පත්වූ නීතිපතිවරුන් මේ සම්බන්ධයෙන් උනන්දුවක් නොදැක්වීම සහ මන්දගාමීව කටයුතු කිරීම නිසා, එම ක්‍රියාදාමයන් මත කර්තෘ කලකිරීමට පත්වී, අභියාචනාධිකරණය ඉදිරියේ පැවති ඔහුගේ මෙම රිට් අයදුම්පත ඉල්ලා අස්කර ගන්නා ලදී. පැහැදිලි ලෙස මෙය යහපාලනය ප්‍රතිපත්තියට පටහැනි බව මෙම ග්‍රන්ථයෙන් අනාවරණය කර ඇත.

ඉහත කී ක්‍රියාකාරකම් එසේ තිබියදී, මෙම ග්‍රන්ථයේ තවත් පරිච්ඡේදයකින් සවිස්තරාත්මකව මනාසේ එළිදරව් වන්නේ, මෙම මහජන සම්පත් මෙසේ මංකොල්ල කෑම වැළැක්වීමට දැරූ උත්සාහයන් සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ රජයේ අදාල විෂය භාර අමාත්‍යවරුන් විසින් නීති උල්ලංඝනය කර ඇති බව ඇතුළුව, මහජන සුභ සිද්ධියට අහිතකර ලෙස ඉහත කී නොයෙක් නීති නීතිගත වීමයි.

ඔවුන් පමණක් නොව, එක්සත් ජාතීන්ගේ සංවිධාන (UN), ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව (World Bank) මෙවැනි වගකීම් පිළිබඳ බැඳී සිටි, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් (Transparency International) වැනි රාජ්‍ය නොවන ආයතන පවා, ඉහත කී බරපතල වරදවල් ගැන නොසළකා නිහඬතාවයෙන් සිටියා පමණක් නොව, කර්තෘ විසින් ඔවුන්ව දැනුවත් කර සිටි නමුදු, එම කාරණා ගැන ඔවුන් විසින් කිසිම ක්‍රියාමාර්ගයක් හෝ ප්‍රකාශයක් නොකිරීම සහ එමගින් ගෝලීය වශයෙන් යථාර්ථය පිළිඹිබු කරන ගැටලු සහගත සහ ප්‍රශ්නකාරී සත්‍ය යථාර්ථය එළිදරව් වන අතර, එයින් නීතියේ ආධිපත්‍යය ඛවටීමක් සහ යුක්තිය විහිළුවක් වේ. !

තවද මෙම විශාල ගවේෂණාත්මක ග්‍රන්ථයේ තවත් පරිච්ඡේදයකින් හෙළිදරව් කර ඇත්තේ, රටේ අපනයනයන් වෙනුවෙන් ලබා ගත යුතු මුදල් සම්භාරය මෙරටට නොලැබෙන බවත්ය. කර්තෘ රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ (PERC) සභාපති ලෙසට, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ අනුමැතිය අනුව, විනිමය පාලක විසින් අපනයනකරුවන්ගේ අපනයන වලට ලැබිය යුතු ආදායම නැවත මෙරටට

ලැබෙනවා දැයි සොයා බැලීමට හේතු වී, විනිමය පාලක මගින් ඒ සඳහා ස්වේච්ඡා සමීක්ෂණයක් කරවන ලදී. - *එනම්:*

**Notification to All Exporters**

Central Bank of Sri Lanka (CBSL) will introduce an export proceeds monitoring mechanism to improve the . foreign exchange management system. The information that the Central Bank will be collecting under this system will also help to improve the compilation of balance of payments statistics and analysis of external sector developments. All exporters are kindly requested to furnish details on exports and export proceeds to me on a quarterly basis.

This monitoring mechanism will be implemented with effect from 03 January 2005. The relevant forms with the necessary guidelines will be made available to all exporters.

**H.A.G. Hettiarachchi**
**Controller of Exchange**
**H.M.P. Herath**
**Add. Controller of Exchange**


Exchange Control Department
**Central Bank of Sri Lanka**
30, Janadhipathi Mawatha, Colombo 01.
Telephone : 2477244, 2477240 Fax : 2477716
E-mail: ecd@cbsl.lk
Website : http//www.centralbanklanka.org


එම ස්වේච්ඡා සමීක්ෂණයට අපනයනකරුවන්ගෙන් 50% ක් දැක් වූ ප්‍රතිචාර මත එළිදරව් වූයේ, 2004.9.30 වන දිනට අවසන් වූ විශේෂිත කාර්තුව තුල අපනයනයන්ට, 2004.12.31 අවසන් කාර්තුවට පෙර ඉහත කී විදේශ ආදායමෙන් 19% ක් ශ්‍රී ලංකාවට ආපසු නොපැමිණෙන බවයි. එයින්ද 10% ක් ඔවුන් විසින්ම විදේශයේ විවිධ කාරණා සම්බන්ධයෙන් තම අපනයන ආදායමෙන් 10% ක් අනිවාර්යයෙන්ම විදේශයන්හි වියදම් කර ඇති බව පිළිගෙන ඇත.

| | ඇ. ඩො. | % |
|---|---|---|
| ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීම් | 958,640,082 | 81.07% |
| විදේශ වියදම් සඳහා විදේශ රටවල භාවිතා කිරීම | 121,111,158 | 10.24% |
| විදේශ ණය ආපසු ගෙවීම් සඳහා විදේශ රටවල භාවිතා කිරීම | 4,302,571 | 0.36% |
| විදේශ රටවල පිහිටි වාණිජ බැංකුවල රඳවා ගැනීම් | 878,392 | 0.07% |
| කෙටි භාණ්ඩ නිකුත් කිරීම් වටිනාකම | 8,620,554 | 0.73% |
| විදේශ ගැනුම් කරුවන් විසින් පැහැර හැරීම් | 1,439,411 | 0.12% |
| විදේශ ගැනුම්කරුවන්ගෙන් ලැබිය යුතු අපනයන ආදායම් | 87,531,779 | 7.40% |
| **එකතුව** | 1,182,523,947 | 100.00% |

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) VIII ස්ථානයේ සිටි රටවල් අතර ශ්‍රී ලංකාව එක් රටක් වූ අතර, අපනයන ප්‍රේෂණයන් නැවත එම රටවල් වලට ගෙන ඒමට ක්‍රියා කිරීම අවශ්‍ය කර ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සමහර වංචනික රහසිගත උපායන් නිසා, 1993 වර්ෂයේ ශ්‍රී ලංකාවට ආපසු අපනයන වලින් ලැබෙන මුදල් නැවත මෙරටට ගෙන්වා නියාමනය කිරීම සඳහා පැවති විනිමය පාලකගේ බලය අහෝසි කර තිබුණි.

.




2015 දක්වා වසර 22 ක් පුරා 10% ක ගණනයට අනුව, ඩොලර් මිලියන 20,000 ක් නැවත ශ්‍රී ලංකාවට නොගෙන්වීම මත ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිතයට දැවැන්ත අලාභයක් සිදු වී ඇති අතර, කර්තෘ විසින් අඛණ්ඩව සිදු කල ඉදිරිපත් කිරීම් මත, 2016 සිට අපනයනයෙන් ලැබෙන මුදල් නියාමනය කිරීම සඳහා විනිමය පාලකගේ බලතල නැවත ස්ථාපනය කරනු ලැබ ඇති අතර, අපනයන ආදායම නැවත මෙරටට ගෙන්වීම නිරීක්ෂණය කිරීමට රෙගුලාසි බලාත්මක කර ඇති අතර, එවැනි අපනයන පිටවීම සීමා කර තිබුණි.

විදේශ විනිමය ශේෂය වශයෙන් ඉතාමත් ශක්තිමත් සහ විශාල, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) VIII ස්ථානයේ සිටි රටවල් වන චීනය සහ ඉන්දියාව පවා, අපනයන ආදායම තම රටවල් වලට සම්පූර්ණයෙන්ම ගෙන්වා ගැනීම සහ, එය නිරීක්ෂණය කිරීමට විනිමය පාලනය දැඩිව ක්‍රියාත්මක කර ගෙන යනු ලබයි. ඊට අමතරව, ඉන්දියාව එම ගෙන්වූ විදේශ විනිමය ඉන්දීය මුදල් බවට පරිවර්තනය කිරීමට අනිවාර්ය කිරීමටද කටයුතු කර ඇත. නමුත් එය එසේ තිබියදී, ඉන්දියාවෙහි හා චීනයෙහි විදේශ විනිමය ශේෂය සමඟ සන්සන්දනාත්මක ලෙස ගත් කල, විදේශ විනිමය ශේෂය දුර්වල තත්වයේ පවතින ශ්‍රී ලංකාව 1993 වසරේ සිට ඉහත කී ලෙස නියාමනය නොවන අපනයන ලැබීමට ක්‍රියා කිරීම ඛේදජනක සහ හාස්‍යජනක කාරණයක් නොවන්නේද ? !

තවද මෙම ග්‍රන්ථයේ තවත් පරිච්ඡේදයකින් හෙළිදරව් කර ඇත්තේ, වැට් (VAT) බදු මහා පරිමාණ වංචාව පිළිබඳව විගණකාධිපති විසින් භාණ්ඩාගාරයේ මූල්‍ය කළමනාකරණය දැඩි ලෙස විවේචනයට ලක් කරමින්, පාර්ලිමේන්තුවට විශේෂ වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවය. මෙහි පසුබිම වී ඇත්තේ වැට් (VAT) බදු මහා පරිමාණ වංචාව පිළිබඳව 2003 වසරේදී විගණනකාධිපති නැඟූ ප්‍රශ්න වලට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් හෝ භාණ්ඩාගාරයෙන් නිසි පිළිතුරු නොලැබීම හේතුකොට ගෙන වන අතර, එයින් ඇතිවන අවධානම් තත්වය පිළිබඳ දැනුම්දීමක් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉහත කී විශේෂ වාර්තාව ඉදිරිපත් කර ඇත. - *එනම්:*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
හයවැනි පාර්ලිමේන්තුවේ
(දෙවැනි සැසිවාරය)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 02

இலங்கை சனநாயக சோசலிசக் குடியரசினது
ஆறாவது பாராளுமன்றத்தின்
(இரண்டாவது அமர்வு)

பாராளுமன்றத் தொடர் இல : 02

**PARLIAMENTARY SERIES No : 02**

**OF THE SIXTH PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**
**(SECOND SESSION)**

(ඉංග්‍රීසි මුද්‍රණය/ஆங்கிலப் பதிப்பு / English Print)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර

**රාජ්‍ය බදු ආදායම් කළමනාකරණය ආශ්‍රිත විශේෂ**
**ව්‍යාපෘති විගණනය පිළිබඳව**
**විගණකාධිපතිවරයාගේ වාර්තාව**


இலங்கை சனநாயக சோசலிசக் குடியரசு அரசியல் யாப்பின் 154(6) ஆம் உறுப்புரையின் பிரகாரம்

அரசாங்க வரி வருமானத்தின் முகாமைத்துவம் மீதான விசேட செயற்திட்டக் கணக்காய்வு கணக்காய்வாளர் தலைமை அதிபதியின் அறிக்கை

**REPORT OF THE AUDITOR GENERAL ON SPECIAL PROJECT AUDIT ON THE MANAGEMENT OF GOVERNMENT TAX REVENUE**

**IN TERMS OF ARTICLE 154(6) OF THE CONSTITUTION OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

මේ අතරතුර, රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ (PERC) සභාපති ලෙස කර්තෘ විසින් 2004 ජූනි මස මේ පිළිබඳව දැනගත් විගස, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ අනුදැනුම මත, එවකට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්ගෙන් විමසනු ලැබූ අතර, මහා පරිමාණ වැට් (VAT) බදු වංචාවක් සිදුවී ඇති බව ඔහු විසින් පිළිගෙන, එයට අදාළව පියවර ගැනීමට උත්සාහ දැරීමෙන් ඔහුගේ ජීවිතයට හානියක් වේ යැයි පවසා සිට ඇත.



ඔහු එම මහා පරිමාණ වංචාව පිලිබඳව ශ්‍රී ලංකා පොලීසියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට යොමු කිරීමට මැලි වූ බැවින්, කර්තෘ විසින් ස්වේච්ඡාවෙන් යුතුව එය මෙහෙයවීමට, ඔහුට එය ජනාධිපති විමර්ශන කාර්යාලය මගින් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ විමර්ශනයට ලක් කිරීමට හැකි බව සඳහන් කරන ලදී. එයද කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් පසුබට විය.

නමුත් ඒ අතරතුර, එම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් සහ එවකට භාණ්ඩාගාරයේ ලේකම් පී. බී. ජයසුන්දරගේ එකඟත්වය අනුව, ඉහත කී මහා පරිමාණ වැට් (VAT) බදු වංචාව පිලිබඳව විමසීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කමිටුවක් පත්කිරීමෙන්, මෙම මහා පරිමාණ වංචාවට අදාල ලිපි, ලේඛන සහ දත්ත අස්ථානගත කිරීමට හෝ විනාශ කිරීමට අවස්ථාවක් සලස්වා දී තිබුණි. පසුව මහාධිකරණයේ මෙම මහා පරිමාණ වැට් (VAT) බදු වංචාව සම්බන්ධව ගොනු කර තිබූ නඩු වලින්, එය මනාසේ එළිදරව් විය.

තවද පුදුමාකාර ලෙස මෙම මූල්‍ය පාලනය පිළිබද ග්‍රන්ථයේ අඩංගු තවත් අද්විතීය පරිච්ඡේදයක් වූයේ, 2008 විසර්ජන පනත කර්තෘ විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් කිරීමය. එහිදී ඔහු පෞද්ගලිකව පෙනී සිට, වාචික සහ ලිඛිත ඉදිරිපත් කිරීම් සිදු කරමින් සත්‍ය එළිදරව් කරන ලදී. කර්තෘගේ එළිදරව් කිරීම් පිළිගත් ශ්‍රේෂ්ඨාධිකරණය රටේ ඉතාමත් විශාල ණය ප්‍රමාණයක් එම කෙටුම්පතේ සම්පූර්ණයෙන්ම අඩංගු කර නොතිබූ බවත්, එය එසේ කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව එම විසර්ජන පනත් කෙටුම්පතට නව උපලේඛනයක් ඇතුලත් කොට, ශ්‍රී ලංකා රජය විසින් ලබා ගන්නා ලද මුළු ණය ප්‍රමාණය පාර්ලිමේන්තුවට දන්වන ලෙස නියෝග කරන ලදී.

තවද ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ නිශ්චය මගින් භාණ්ඩාගාරයේ මූල්‍ය අවපාලනය දැඩි ලෙස හෙළා දැක, “සංවර්ධන ක්‍රියාකාරකම්“ සඳහා යයි පවසමින් හොර රහසේ විශාල මුදල් සංචිතයක් භාණ්ඩාගාරයේ තබා ගෙන, එම මුදල් සංවර්ධන ක්‍රියාකාරකම් වලින් වඩාත් දුරස් වූ කාර්යයන් සඳහා වියදම් කර, ඒ අනුව, එමගින් එම මහජන මුදල් පාර්ලිමේන්තුවේ අවසරයකින් තොරව, භාණ්ඩාගාරයෙන් වෙනම අභ්‍යන්තර රහස් ගිවිසුමක්

මගින් ‘‘ඔවුන්ගේ අයවැයක් පමණක්‘‘ ලෙස සළකා, ක්‍රියාත්මක කිරීම දැඩි ලෙස දෝෂාරෝපණයට ලක්කර ඇති අතර, එසේ සිදු කර ඇත්තේ එකී ක්‍රියාවන් මගින් මහජන මූල්‍ය පාලනයේ භාරකාරත්වය උල්ලංඝනය කර ඇති බව නිගමනය කිරීමෙනි.